# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,303 - 2022 ඔක්තෝබර් මස 21 වැනි සිකුරාදා - 2022.10.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1848 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1849 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1855 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1856 |


*සැ. යු.* -(i) දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත 2022 ඔක්තෝබර් මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2022 ඔක්තෝබර් මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 නොවැම්බර් මස 11 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ඔක්තෝබර් මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**ගර්හිත කල භාණ්ඩ විකිණීම සඳහා ලංසු කැඳවීම**

ලංසු අංකය - SD/V/2022

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අයත් ගර්හිත කරන ලද පහත සඳහන් භාණ්ඩ විකිණීමට ලංසු කැඳවනු ලැබේ.

02. වෙන්දේසියට අදාළ භාණ්ඩ ලැයිස්තුව හා භාණ්ඩ පරීක්ෂා කර බැලීම **2022 නොවැම්බර් මස 10** වැනි දින දක්වා කාර්යාල වේලාවන්හි දී ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (ප්‍රසම්පාදන හා සැපයීම්), ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (සම්පත් කළමණාකරණ) ගේ අධීක්ෂණය යටතේ සිදු කළ හැක.

03. ලංසු ඉදිරිපත් කිරීම සඳහා අදාළ ලංසු පත්‍ර අයදුම්පත් නැවත ආපසු නොගෙවන රුපියල් දහස (1,000) ක මුදලින් කරනු ලබන ගෙවීම් මත **2022.11.10 දින ප. ව. 2.30** දක්වා කොළඹ 05, කිරුළ පාරේ අංක 150 පිහිටි සර්වේයර් ජනරාල් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (ප්‍රසම්පාදන හා සැපයීම්) වෙතින් ලබා ගත හැක.

04. එක් එක් අයිතම තොගය සඳහා (Lot) වෙන වෙනම සකස් කල ලංසු පත්‍ර කවරයක බහා මුද්‍රා තබා කවරයේ ඉහළ වම් කෙලවරේ ''තොග අංකය ------ '' සහ ''ගර්හිත කරන ලද භාණ්ඩ සඳහා මිල ගණන්'' යන්න සඳහන් කර **2022 නොවැම්බර් මස 11 වැනි දින පෙ. ව. 11.00** ට පෙර ලැබෙන සේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (ප්‍රසම්පාදන හා සැපයීම්), මිනින්දෝරු දෙපාර්තමේන්තුව, අංක 150, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05 යන ලිපිනයට එවිය යුතු ය. නැතහොත් ප්‍රසම්පාදන හා සැපයීම් අංශයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය යුතු ය. එදිනම පෙ. ව. 11.05 ට ලංසු විවෘත කරනු ලබන අතර එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයකුට සහභාගි විය හැක.

05. ප්‍රමාද වී ලැබෙන හෝ අසම්පූර්ණ ලෙස ඉදිරිපත් කර ඇති ලංසු ප්‍රතික්ෂේප කරනු ලබන අතර, භාණ්ඩ විකිණීමේදී ඉදිරිපත් කරන ලංසුවේ වටිනාකමට අමතරව එදිනට පවතින වැට් බද්ද ද ගැනුම්කරු විසින් ගෙවිය යුතු ය. මෙම විකිණීම හා සබැඳි කරුණු පිළිබඳව සර්වේයර් ජනරාල් විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

විකිණීමට යෝජිත ගර්හිත කරන ලද භාණ්ඩ වර්ග :-

01. ලැප්ටොප්
02. ෆැක්ස් යන්ත්‍ර, යතුරුලියන, මුද්‍රණ යන්ත්‍ර සහ පරිලෝකන යන්ත්‍ර
03. පරිගණක සහ පරිගණක උපාංග
04. මැනුම් උපකරණ සහ උපාංග
05. පරිගණක පුටු, පරිගණක මේස සහ ලාච්චු හතරේ වානේ කබඩ්
06. විදුලි උපකරණ
07. නියැකීමේ උපකරණ
08. වෙනත් අබලි ද්‍රව්‍ය (ඉබි යතුරු, ජලපෙරන ආදිය)

සර්වේයර් ජනරාල්,
සර්වේයර් ජනරාල් කාර්යාලය.

අංක 150, කිරුළ පාර
කොළඹ 05.
දුරකථන අංක : 011 2368106, 011- 2369034

2022 ඔක්තෝබර් මස 21 වැනි දින.

10-311

# බඩු බාහිරාදිය විකිණීම්

සංශෝධනයයි

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - කන්තලේ**

නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - 2022.11.12

2022.10.14 දින පළ වූ අංක 2302 *ගැසට් පත්‍රයේ* 10-210 නිවේදනයේ 2022.10.29 වැනි දින පැවැත්වීමට නියමිතව තිබූ වෙන්දේසිය නොවැළැක්විය හැකි හේතුවක් මත අවලංගු කල අතර එය **2022.11.12 වැනි දින පෙ. ව. 9.30** ට කන්තලේ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී පවත්වනු ලැබේ.

එම *ගැසට් නිවේදනයේ* පළ වූ අනිකුත් කොන්දේසි නොවෙනස්ව පවතී.

එච්. දිනිදු සමරසිංහ,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
කන්තලේ.

10-317

---

සංශෝධනයයි

**මහෙස්ත්‍රාත් අධිකරණය, කල්මුණේ**

ප්‍රසිද්ධ වෙන්දේසි දැන්වීමයි

2022.10.14 වැනි දින පළ වූ අංක 2302 දරන *ගැසට් පත්‍රය* මගින් 2022.10.29 වැනි දින පැවැත්වීමට නියමිත තිබූ ප්‍රසිද්ධ වෙන්දේසිය නොවැළැක්විය හැකි හේතුවක් මත කල් දැමීමට සිදු විය.

එම ප්‍රසිද්ධ වෙන්දේසිය එළැඹෙන **2022.11.19 වැනි දින පෙරවරු 9.00** ට පැවැත්වීමට නියමිතව ඇති බව දන්වා සිටිමි.

එම *ගැසට් නිවේදනයේ* පළ වූ අනිකුත් කොන්දේසි නොවෙනස්ව පවතී.

එම්. එස්. එම්. සම්සුදීන්,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
කල්මුණේ.

2022 ඔක්තෝබර් මස 17 වැනි දින.

10-318

**පල්දෙණිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය**

පල්දෙණිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පල්දෙණිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරනු ලැබූ භාණ්ඩ **2022.10.30 වැනි දින පෙ.ව. 9.30** ට එම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. පහත සඳහන් භාණ්ඩ ලැයිස්තුවේ සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම්පාන්නෙකු වේ නම්, වෙන්දේසිය පවත්වන දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කල යුතු අතර, ඒ පිළිබඳ සලකා බැලීම සඳහා අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරියගේ අවසර ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය එක හමාරකට පෙර වෙන්දේසියට නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර දැමීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ භාර ගැනීමේ දී හා මුදල් ගෙවීමේ දී තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර මිලදී ගැනීමට පැමිණෙන සෑම අයෙකුටම ජාතික හැඳුනුම්පත තිබීම අනිවාර්ය වේ.

06. භාණ්ඩ මිලදී ගැනීම මුදලින් කළ යුතු අතර මිලදී ගන්නා ලද භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේ දී ප.ව. 04.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

ආර්. නිෂාධි කේ. චන්ද්‍රවංශ,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
නාඋල.

2022 ඔක්තෝබර් මස 03 වැනි දින,
නාඋල මහෙස්ත්‍රාත් අධිකරණයේදී ය.

### පල්දෙණිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ

වෙන්දේසි ලැයිස්තුව - 2022 ඔක්තෝබර්

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තර |
|---|---|---|
| 01 | 36003(B705/20) | උදළු 02, අලවංගු 03, කුළු ගෙඩි 01 |
| 02 | 29490 | මුට්ටිය |
| 03 | AR1664/10 | පාපැදිය |
| 04 | AR1052/21 | පාපැදිය |
| 05 | 24188 | කහ පැහැති ගෑස් ටැංකිය, රෙගියුලේටරය, බටය |
| 06 | 13410 ( B 60/15) | වතුර මෝටර් 01 |
| 07 | 12480 | ගෑස් ලිපක් |
| 08 | 38278 | ප්‍රෙශර් කකුර් 01 |
| 09 | අංක රහිත | බෝතල් තොගයක් |
| 10 | අංක රහිත | බැරල් තොගයක් |
| 11 | අංක රහිත | බූලි තොගයක් |
| 12 | AR370/21 | CPTT - 9451 දරන යතුරු පැදිය |
| 13 | AR514/13 | 112-8680 යතුරු පැදිය |
| 14 | AR371/21 | CPUX 7522 දරන යතුරු පැදිය |
| 15 | AR1100/10 | යතුරු පැදියක් Eng No: 07041507 Ch No: 070000066 |
| 16 | 10327(B604/12) | CT100 යතුරු පැදිය (NCUU 4708) |
| 17 | 31786 | CPDAE 8739 දරන ලොරි රථය |
| 18 | 27528 (B. 318/18) | වායු පීඩන යන්ත්‍රය |

10-224

---

### දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මහව

### මෙම අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් කියන්නන් ඉදිරිපත් නොවූ නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද පහත උපලේඛනයේ සඳහන් නඩු භාණ්ඩ **2022.11.02 වැනි දින පෙ. ව. 10.00** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙහි පහත සඳහන් වන නඩු භාණ්ඩ පිළිබඳ හිමිකම්පාන්නකු සිටි නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු වේ.

03. උපලේඛනයේ සඳහන් නඩු භාණ්ඩ අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින වෙන්දේසිය පැවැත්වීමට පැය භාගයකට ප්‍රථම ගැණුම්කරුවන්ට පරීක්ෂා කළ හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතු වේ.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේ දී මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදල්වලින් පමණක් සිදු කළ යුතු අතර, මුදල් ඇණවුම් හෝ චෙක්පත් භාර ගනු නොලැබේ.

06. වෙන්දේසියේ භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන ගැණුම්කරුවන් තම අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

ඩබ්. එම්. නුවන් ප්‍රියනීල් ගුණසේකර,
දිසා විනිසුරු මහෙස්ත්‍රාත්,
මහව.

2022 ක් වූ ඔක්තෝබර් මස 04 වැනි දින,
මහව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේදී ය.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ වර්ගය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | 22980/S | කපන කටු | 01 |
| | | යකඩ මිටි | 01 |
| | | යකඩ බාල්දි | 01 |
| 02 | 23057/MISC | නයිලෝන් ලණු | 01 |
| | | යකඩ බාල්දි | 01 |
| 03 | 31544/MISC | සවල් | 01 |
| | | උදලු | 01 |
| 04 | 31260/F | ලී මිට සහිත කැති | 01 |
| 05 | 31255/F | ලී මිට සහිත කැති | 03 |
| 06 | 25547/S | උදලු | 01 |
| | | යකඩ ඉනි | 01 |
| 07 | 04407/MISC | යකඩ සවල් | 02 |
| 08 | 05123/S | ලී මිට සහිත පොරව | 01 |
| 09 | 23218/F | යාන්ත්‍රික දම්වැල් කියත් | 01 |
| 10 | AR 584/20 | ලොකු ඇළුමිනියම් මුට්ටි | 01 |
| 11 | 34546/S | යකඩ ඉනි | 01 |
| | | සවල් | 03 |
| | | සාස්පාන් | 01 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ වර්ගය | ප්‍රමාණය |
|---|---|---|---|
| | | ප්ලාස්ටික් බේසම් | 01 |
| 12 | 20841/PC | යකඩ ගේට්ටු | 01 |
| | | එල් අයරින් | 01 |
| | | ගැල්වනයිස් බට | 01 |
| | | සුදු යකඩ කුඩා අත්වැට | 01 |
| 13 | 79265/F | යාන්ත්‍රික දම්වැල් කියත් | 01 |
| 14 | 23536/ S | යකඩ ඉනි | 02 |
| | | උදලු | 02 |
| | | කුලුගෙඩි | 01 |
| 15 | 99604/E | ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 16 | 36592/E | නිල්පාට ප්ලාස්ටික් බැරල් | 02 |
| 17 | 13524/F | දැව භාණ්ඩ | |
| 18 | 36761/E | නිල්පාට ප්ලාස්ටික් බැරල් | 01 |
| 19 | 36279/E | ගෑස්ලිප් | 01 |
| | | සිලින්ඩර් | 01 |
| 20 | 24329/E | නිල් පාට ප්ලාස්ටික් බැරල් | 01 |
| 21 | 13524/F | තේක්ක සහ බුරුත දැවවලින් සාදන ලද විවිධ ප්‍රමාණයේ ජනෙල් පියන් | 15 |
| | | තේක්ක සහ බුරුත දැවවලින් සාදන ලද විවිධ ප්‍රමාණයේ දොර පියන් | 05 |
| 22 | 35174/MISC | වැලි කියුබ් | 03 |
| 23 | 35201/MISC | වැලි කියුබ් | 01 |
| 24 | 35543/MISC | වැලි කියුබ් | 03 |
| 25 | 35575/MISC | වැලි කියුබ් | 01 |
| 26 | 35669/MISC | වැලි කියුබ් | 01 |
| 27 | 36606/MISC | වැලි කියුබ් | 01 |
| 28 | අංක රහිත | ලොකු බූලි | 50 |
| 29 | අංක රහිත | පොඩි බූලි | 50 |
| 30 | අංක රහිත | හතරැස් බෝතල් | 500 |
| 31 | අංක රහිත | රවුම් බෝතල් | 500 |
| 32 | අංක රහිත | හිස් බියර් බෝතල් | 100 |
| 33 | අංක රහිත | කේක් තැටි | 03 |
| 34 | අංක රහිත | යකඩ බැරල් | 60 |
| 35 | අංක රහිත | පොල්ගෙඩි | 100 |

10-239

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මොණරාගල

2022.11.05 දිනැති වෙන්දේසිය සම්බන්ධවයි

මොණරාගල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ 2022.11.05 දිනට පැවැත්වීමට සූදානම් කර තිබූ, 2022.10.07 දිනැති අංක 2301 ගැසට් පත්‍රයේ පළකර තිබූ ප්‍රසිද්ධ වෙන්දේසිය නොවැළැක්විය හැකි හේතුවක් මත එදිනට නොපැවැත්වෙන බවත්, **2022.11.19** දින එම වෙන්දේසිය පැවැත්වෙන බව දන්වා සිටිමි.

එම දැන්වීමේ අනිකුත් කොන්දේසි නොවෙනස්ව පවතී.

දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
මොණරාගල.

2022 ඔක්තෝබර් මස 11 වැනි දින,
මොණරාගල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

10-241

---

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - කැබිතිගොල්ලෑව

### ප්‍රසිද්ධ භාණ්ඩ වෙන්දේසිය

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ, හිමිකම් නොපාන ලද නඩු අංක මැකී ඇති නඩු වාර්තා සොයා ගැනීමට අපහසු පහත සඳහන් භාණ්ඩ **2022.11.05** වැනි දින **පෙ. ව. 10.00** ට කැබිතිගොල්ලෑව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් දක්වන්නේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර හෝ එදින වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

3. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසි දින නියමිත වේලාවට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍ය මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි ය.

4. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව පිළිනොගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

5. වෙන්දේසියෙන් මිළදී ගනු ලබන භාණ්ඩ එවෙලේ ම මුදල් ගෙවා ප. ව. 3.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

6. වෙන්දේසියෙන් මිළදී ගන්නා ලද භාණ්ඩ සඳහා ගැණුම්කරු විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

7. වෙන්දේසිය පිළිබඳව පැමිණිලි කිසිවක් වෙතොත් එදින වෙන්දේසියේ රාජකාරි අවසන් වීමට පෙර අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරිය වෙත දැන්විය යුතු අතර, ඊට පසුව ලැබෙන පැමිණිලි භාරගනු නොලැබේ.

8. මෙම භාණ්ඩ වෙන්දේසිය පිළිබඳව සියලුම කටයුතු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරන බව ද වැඩිදුරටත් සඳහන් කරමි.

කසුන් කාංචන දසනායක,
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
කැබිතිගොල්ලෑව.

2022 ඔක්තෝබර් මස 06 වැනි දින,
කැබිතිගොල්ලෑව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**කැබිතිගොල්ලෑව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ 2022.11.05 වැනි දින පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ නඩු භාණ්ඩ ලැයිස්තුව**

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 1. | 8158 | රත්ති කිරිපිටි ග්‍රෑ. 400 පැකට් 10යි |
| | | වීවා කිරිපිටි ග්‍රෑ. 400 පැකට් 07යි |
| | | ඇන්කර් කිරිපිටි ග්‍රෑ. 400 පැකට් 08යි |
| | | හෝර්ලික්ස් කිරිපිටි ග්‍රෑ. 400 පැකට් 11යි |
| | | නෙස්ටමෝල්ට් ග්‍රෑ. 175 පැකට් 2යි |
| | | රත්ති තේ මුසුව ග්‍රෑ. 400 පැකට් 4යි |
| | | ඇන්ලීන් කිරිපිටි ග්‍රෑ. 400 පැකට් 03යි |
| | | මයිලෝ කිරිපිටි ග්‍රෑ. 200 පැකට් 01යි |
| | | මිල යෙදීමට භාවිතා කරන යන්ත්‍ර 01යි |
| 2. | 8210 | සම්බා සහල් කි. ග්‍රෑ. 01 පාර්සලය |
| 3. | 9110 | සම්බා සහල් කි. ග්‍රෑ. 01 පාර්සලය |
| 4. | 8206 | නාඩු සහල් කි. ග්‍රෑ. 01 පාර්සලය |
| 5. | 8209 | නාඩු සහල් කි. ග්‍රෑ. 01 පාර්සලය |
| 6. | 8212 | නාඩු සහල් කි. ග්‍රෑ. 01 පාර්සලය |
| 7. | 8208 | නාඩු සහල් කි. ග්‍රෑ. 05 පාර්සලය |
| 8. | 8207 | සුදු කැකුළු සහල් කි. ග්‍රෑ. 05 පාර්සලය |
| 9. | 8211 | කැකුළු සහල් කි. ග්‍රෑ. 05 පාර්සල් 05 යි |
| 10. | 7894 | මාෂල් 20 වර්ගයේ මි. ලී. 200 අඩංගු බෝතල් 07යි |
| 11. | 4623 | ලොකු යකඩ මිටි 01යි |
| | | අලවංගු 01යි |
| 12. | 96066 | කොළ පැහැති ලොරි ආවරණ රෙදි 01යි |
| | | රතු වර්ණයේ ජැක් 01යි |
| | | යකඩ දම්වැල් (දිග මීටර් 4.6) 01යි |
| | | කළු හෙල්මට් 01යි |
| 13. | 7832 | විදුලි තරාදි 01යි |
| 14. | 6343 | අලවංගු 01යි |
| | | ඉල්ලම් කුරු 01යි |
| | | ලී මිට සහිත කුළු ගෙඩි 01යි |
| | | යකඩ පැතලි කටු 01යි |
| | | යකඩ උල්කුරු 01යි |
| | | ලී මිට සහිත උදළු 01යි |
| | | ප්ලාස්ටික් තාච්චි 01යි |
| | | ඇළුමිණියම් නැඹිලි 01යි |
| | | ඇළුමිණියම් අඩි වලං 01යි |
| | | සුදු පාට ප්ලාස්ටික් බාල්දි 01යි |
| 15. | 7956 | විදුලි ජනක යන්ත්‍ර 01යි |
| 16. | | කැති 48 |
| 17. | | උදළු 24 |
| 18. | | සවල් 60 |
| 19. | | පොරෝ 12 |
| 20. | | වානේ අල්මාරි 02 |
| 21. | | ඇඳි බංකු 02 |
| 22. | | වානේ කබඩ් (ලාච්චු 04) 02 |
| 23. | | සිවිලිං විදුලි පංකා 13 |
| 24. | | පුටු ලී ඇඳි සහිත 26 |
| 25. | | පුටු ලී ඇඳි රහිත 10 |
| 26. | | පුටු කුෂන් කැරකෙන 01 |
| 27. | | ෆැක්ස් යන්ත්‍ර 01 |
| 28. | | පරිගණක යන්ත්‍ර (CPU) 03 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 29. | | පරිගණක මුද්‍රණ යන්ත්‍ර 01 |
| 30. | | පරිගණක මොනිටර් 05යි |
| 31. | | පරිගණක බැටරි (යූපීඑස්) 03 |
| 32. | | ඡායා පිටපත් යන්ත්‍ර 02 |
| 33. | | ස්ටූල් - සේප්පු 01 |
| 34. | | මේස ලී පරිගණක 01 |
| 35. | | මේස ලී වෙනත් 01 |
| 36. | | වතුර ටැංකි ප්ලාස්ටික් 01 |
| 37. | | වායු සමන යන්ත්‍ර 01 |
| 38. | | ඇළුමිණියම් කලගෙඩි 15 |
| 39. | | රබර් බට කි. ග්‍රෑ. 15 |
| 40. | | ප්ලාස්ටික් බූලි 30 |
| 41. | | වීදුරු බෝතල් 150 |
| 42. | | බොරළු කියුබ් 40.5. |

10 - 251

---

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - වාරියපොල

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. වාරියපොල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ **2022.11.19 වැනි සෙනසුරාදා දින පෙරවරු 9.00** ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම්පාන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ලිඛිතව අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරිය වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ඇතිව වෙන්දේසියට පැය භාගයකට පෙර විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිළ දී ගනු ලබන ද්‍රව්‍යයන් එවෙලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිළදී ගන්නා ගැණුම්කරුවන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

බුද්ධික මල්වත්ත,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
වාරියපොල.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
වාරියපොල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### උපලේඛනය

| අනු. අංකය | නඩු අංකය | පීආර් අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|---|
| 01. | බී 18706/19 | 3008/19 | 153 - 9728 දරන යතුරු පැදිය |
| 02. | ඒආර් 578/20 | 878/20 | 147 - 5094 දරන යතුරු පැදිය |
| 03. | ඒආර් 322/20 | 1064/20 | V 50 - 7251074 දරන යතුරු පැදිය ලි. ප. අංකය ප්‍රදර්ශනය නොවේ. 125 - 5175 (මෝටර් රථ පරි. වාර්තාව අනුව) |
| 04. | ඒආර් 577/20 | 2030/20 | CP TA 1347 දරන යතුරු පැදිය |
| 05. | ඒආර්. 563/20 | 759/20 | WP UP 4965 දරන යතුරු පැදිය |
| 06. | 10472/18 | 1130/18 | NW BFI 2202 දරන යතුරු පැදිය |
| 07. | 10506/18 | 124/18 | NW WX 2131 දරන යතුරු පැදිය |
| 08. | 10843 | 1485 | NW DAD 4288 දරන ලොරි රථය |
| 09. | 84379 | 93 | අංක 36 ශ්‍රී 9440 දරන ට්‍රැක්ටර් රථය සහ ට්‍රේලරය - අංක 44 ශ්‍රී 6086 ට්‍රේලරය |
| 10. | 94880 | 101/12 | 48 - 8529 දරන ලොරි රථය |
| 11. | 91519/13 | 1612 | 227 - 8783 දරන ලොරි රථය |
| 12. | 22797 | 2444/20 | සවල් 01 |
| 13. | 23251 | 2777/20 | සවල් 01 |
| 14. | 21202 | 1387/20 | සවල් 03, උදලු 01 |
| 15. | 16688 | 1562/19 | සවල් 01 |
| 16. | 20202 | 563/20 | සවල් 02 |
| 17. | 21356 | 1381/20 | සවල් 01 |
| 18. | 16693 | 1560/19 | සවල් 01, උදලු 01 |
| 19. | 24899 | 304/21 | 12.8 ලාෆ් කහ පාට ගෑස් සිලින්ඩර් 01 සහ ගෑස් ලිප් 01 |

| අනු. අංකය | නඩු අංකය | පීආර් අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|---|
| 20. | 26653 | 866/21 | 12.5 නිල් පාට ගෑස් සිලින්ඩර් 01 සහ ගෑස් ලිප් 01 |
| 21. | 28379 | 2868/21 | ලිට්‍රෝ ගෑස් සිලින්ඩර් 01, ගෑස් ලිප් 01 |
| 22. | 24010 | 1382/20 | ලාෆ් ගෑස් සිලින්ඩර් 01 (ගෑස් සහිත) ගෑස් ලිප් 01 |
| 23. | 31065 | | ලාෆ් ගෑස් සිලින්ඩර් 04 (ගෑස් සහිත) |
| 24. | 25390 | 633/21 | 7.8 ලාෆ් ගෑස් සිලින්ඩර් 01 සහ ගෑස් ලිප් 01 |
| 25. | 26987 | 1036/21 | 12.1 ලාෆ් ගෑස් සිලින්ඩර් 01 සහ ගෑස් ලිප් 01 |
| 26. | 24848 | 3811/21 | ලිට්‍රෝ වර්ගයේ ලොකු ගෑස් සිලින්ඩර් 01 සහ ගෑස් ලිප් 01 |
| 27. | 25168 | 468/21 | 12.9 ලාෆ් ගෑස් සිලින්ඩර් 01 සහ ගෑස් ලිප් එකයි |
| 28. | 17577 | | සෝස් පෑන් එකයි |
| 29. | 21635 | 1597/20 | කලු පාට ආෆිකෝ වර්ගයේ හිස් ටැංකි එකයි |
| 30. | ඒආර් 811/19 | 2896/19 | කලු පාට දිග බට අඩි 18 කොළ පාට වතුර බට අඩි 16 අඩි 02ක් දිග යකඩ බට 01 සවිකල |
| 31. | ඒආර් 443/20 | 1716/20 | බට අඩි 18යි, බට අඩි 11 ක යකඩ බටය සවිකල |
| 32. | ඒආර් 781/19 | 2813/19 | අඩි 35ක් දිග අගල් 02 වතුරබට 01 යි |
| 33. | ඒආර් 604/19 | 2040/19 | අඩි 140 ක් හා 150 ප්‍රමාණයක වතුර බට කලු පාට 02ක් හා අඩි 20 ක් දිග කොළ පාට වතුර බට 01යි, අඩි 03 ක් දිග යක බටය සවිකර |
| 34. | ඒආර් 313/20 | 1382/20 | මුළු දිග අඩි 200 ක අඟල් 02 ප්‍රමාණයේ බට එකයි, මුළු දිග අඩි 50 බට එකයි |
| 35. | ඒආර් 314/20 | - | කලු පාට අඟල් 02 වතුර බට අඩි 105 යි |

**අධිකරණයෙන් ඉවත් කරන ලද වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ ලැයිස්තුව**

| අනු. අංකය | භාණ්ඩයේ වර්ගය | ප්‍රමාණය | තත්ත්වය |
|---|---|---|---|
| 36. | කැබිනට් වානේ (ලාච්චු) | 02 | 02 ක් අබලන් වී ඇත. |
| 37. | දුරකථන | 02 | ක්‍රියාවිරහිත වී ඇත. |
| 38. | පුටු පරිගණක | 02 | අබලන් වී ඇත. |
| 39. | පුටු සාමාන්‍ය (කැබලි) | 10 | අබලන් වී ඇත. |
| 40. | මේස පරිගණක | 01 | අබලන් වී ඇත. |
| 41. | යතුරු ලියන 6929972 ඔලිම්පියා | 01 | අබලන් වී ඇත. |
| 42. | යතුරු ලියන 7482787 ඔලිම්පියා | 01 | අබලන් වී ඇත. |
| 43. | යතුරු ලියන 7105775 ඔලිම්පියා | 01 | අබලන් වී ඇත. |
| 44. | පරිගණක මොනිටර් LCVSNETKKZOW - 00694TOIE - 274329 | - | අක්‍රිය වී ඇත. |
| 45. | පරිගණක මොනිටර් M. M. L. XSP00151704 ACA 4220 NINPSU88090789 | - | අක්‍රිය වී ඇත. |
| 46. | පරිගණක CPU SINPSU 88090789470 CBB 92700 | - | අක්‍රිය වී ඇත. |
| 47. | පරිගණක CPU EW 26172605 BG 24 | - | අක්‍රිය වී ඇත. |
| 48. | පුටු ඇදි සහිත (කැබලි) | 05 | අබලන් වී ඇත. (කැබලි) |
| 49. | බංකු ඇදි සහිත (තොගය) | 04 | අබලන් වී ඇත. (තොගයට) |

# රජයේ නොවන දැන්වීම්

## විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 06, මයුර පෙදෙස, අංක 50/1 ඩී දරන ස්ථානයේ පදිංචි ප්‍රින්ස් සාගර සේනාරත්න (ජා. හැ. අ. 640123885 V) වන මම සාගර මෝටර්ස් (පුද්ගලික) සමාගම (සමාගම් ලියාපදිංචි අංක (PV 71841) හි අධ්‍යක්ෂකවරයෙකු වශයෙන්, එකී සමාගමේ ඇටර්නි බලකරු වශයෙන් ඔරියන්ට් ෆිනෑන්ස් පීඑල්සී (සමාගම් ලියාපදිංචි අංක PB 1079/PQ) යන ආයතනය පත් කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. ඒ. එන්. සිල්වා විසින් ලියා සහතික කරන ලද අංක 237 හා 2020.01.09 දින දරන විශේෂ ඇටර්නි බලපත්‍රය 2022.10.07 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි අවලංගු සහ බල රහිත කරන බව ශ්‍රී ලංකා ජනරජය සහ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමු. එකී විශේෂ ඇටර්නි බලපත්‍රය බත්තරමුල්ල රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ දින පොත් අංක 3024 වෙලුම් අංක 303 හා පත්තිරු අංක 21 හි ලියාපදිංචි කර ඇති බව ද එකී ඇටර්නි බලපත්‍රය ප්‍රකාරව මින් ඉදිරියට සිදු කරනු ලබන කිසිදු ගනුදෙනුවකට එකී සාගර මෝටර්ස් (පුද්ගලික) සමාගමට වගකීමක් හෝ බැඳීමක් නොමැති බව ද දන්වමු.

ප්‍රින්ස් සාගර සේනාරත්න,
අධ්‍යක්ෂ - සාගර මෝටර්ස් (පුද්ගලික) සමාගම.

10-245

---

## ඇටර්නි බලය අවලංගු කිරීම

කෑගල්ල, බණ්ඩාරනායක මාවතේ, අංක 280 හි පදිංචි අනුජා ගමගෙදර ජා. හැ. අංක 196757710126 වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් ජිනදාස ජයවික්‍රම විසින් ලියා සහතික කළ අංක 1176 සහ 2013.06.01 දිනැති ඇටර්නි බලපත්‍රය මගින් අංක 177/2 ඒ සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කඩවත යන ලිපිනයේ පදිංචි සරත්චන්ද්‍ර රාජපක්ෂ ජා. හැ. ප. 443291199 V යන අයට දෙනු ලැබූ ඇටර්නි බලය අද දින පටන් අවලංගු කර බල රහිත කරන බව ශ්‍රී ලංකා ජනරජයටත්, ශ්‍රී ලංකාවාසී සියලු දෙනාටත් මෙයින් දැනුම් දෙමි.

අනුජා ගමගෙදර.

10-254

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කුරුණෑගල තැපැල් ගැට්ටුවාන පාර, අංක 151/10 යන ලිපිනයේ පදිංචි දේවතා පේජ්ජලාගේ අංජුල අනුර පියසිංහ වන මා විසින් අංක 154, ගැට්ටුවාන පාර, කුරුණෑගල හි පදිංචි වෙද දූරයලාගේ කැලුම් ප්‍රියන්ත ධර්මසේන යන අයට ලබා දී ඇති ප්‍රසිද්ධ නොතාරිස් වසන්තා අමරසේකර මහත්මිය විසින් ලියා සහතික කළ අංක 18685 සහ 2016.01.28 දිනැති ඇටර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කර බලරහිත කර ඇති බව ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

ඩී. පී. ඒ. ඒ. පියසිංහ.

10-255

---

## ඇටර්නි බලය අවලංගු කිරීම

වත්තල, හේකිත්ත, සෙනවිරත්න පාර, අංක 19 (දැනට අංක 57 ටැවිස්ටොක් ඇවනිව්, ග්‍රීන්ෆෝර්ඩ්, පෙරිවේල්, UB68AN, මිඩ්ල්සෙක්ස්, එක්සත් රාජධානිය) හි පදිංචි විමල් රෝයි මාරියනායගම් (ජාතික හැඳුනුම්පත් අංක 197106610037 සහ බ්‍රිතාන්‍ය ගුවන් ගමන් බලපත්‍ර අංක 510011985) වන මම ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඩී. ශිරෝමි පෙරේරා වර්ෂ 2015.12.10 වැනි දින ලියා සහතික කළ අංක 93 දරන ඇටර්නි බලපත්‍රය මගින් මාගේ ඇටර්නි බලකරු ලෙස නො. 819, අලුත් මාවත, කොළඹ 15 හි පදිංචි ජෝසෆ් බැසිල් රෝයි මාරියනායගම් (ජාතික හැඳුනුම්පත් අංක 742700488 V) යන අය පත් කිරීම වර්ෂ 2022.09.27 වැනි දින සිට අවලංගු කරන බව ශ්‍රී ලංකාවාසී සියලු දෙනාට මෙයින් දැනුම් දෙනු ලැබේ.

විමල් රෝයි මාරියනායගම්.

10-256

---

## ඇටර්නි බලය අවලංගු කිරීම

පැලවත්ත, පන්නිපිටිය පාර, අංක 772/සී හි පදිංචි අමරසිංහ නාමින්ද ලක්රුවන් පෙරේරා (ජා. හැ. අංක 693371708 V) ඇටර්නි අධිපති වන මා විසින් 18-2727 දරන මෝටර් රථය සම්බන්ධයෙන් කොළඹ 15, අලුත් මාවත පාර, අංක 737/117 හි පදිංචි පුන්‍යමූර්ති ක්‍රිෂාන් (ජා. හැ. අංක 199929102375) යන ඇටර්නි බලකරු වෙත ලබා දී තිබූ, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නාලනී ඉලංගෝන් මහත්මිය විසින් වර්ෂ 2022.09.04 වැනි දින ලියා සහතික කරන ලද 2022.10.03 දින වෙළුම්/පත්ඉරු අංක 42/67 හි ලියාපදිංචි කරන ලද අංක 151 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කරන බවට ශ්‍රී ලංකා වාසී සියලු දෙනාට මෙයින් දැනුම් දෙමි.

නාමින්ද ලක්රුවන් පෙරේරා.

2022 ඔක්තෝබර් මස 12 වැනි දින දී ය.

10-257

## ඇටර්නි බලය අවලංගු කිරීම

නුනාවිල් බටහිර චාවකච්චේරි සහ දැනට බ්‍රෙමෙන් ජර්මනිය පදිංචි සෙල්ලදුරයි ආරියනායගම් සහ එම ආරියනායගම්ගේ භාර්යාව වන රමණී වන අප විසින් නුනාවිල් බටහිර චාවකච්චේරිය පදිංචි අරුද්චෝති ශාන්තිනී (ජා. හැ. අංක 596780466 V) යන අයට ප්‍රදානය කරන ලද බ්‍රෙමෙන් ජර්මනියෙහි නොතාරිස් වොල්ෆ් ලෙච්මන් (WOLF LESCHMANN) මහතා විසින් ලියා සහතික කරන ලද 2020 මාර්තු මස 12 දිනැති සාමාන්‍ය ඇටර්නි බලපත්‍රය 2022.10.01 වැනි දින සිට අවලංගු වන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ මහජනතාවට මෙයින් දන්වන අතර ඉහත කී බලපත්‍රය ප්‍රකාරව කිසිදු ක්‍රියාවකට කිසිදු වගකීමක් එම අයට නොමැති බව මෙයින් දන්වා සිටිමු.

සෙල්ලදුරයි ආරියනායගම් සහ එම
ආරියනායගම්ගේ භාර්යාව රමණී.

10-280

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

සීදූව, ලියනගේමුල්ල, අංක 150/2 හි පදිංචි කොඩිකාර ශ්‍යාමා චන්ද්‍රකාන්ති වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දෝන චින්තා කුමුදිණී විජේසිංහ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් වර්ෂ 2017.11.28 වැනි දින ලියා සහතික කළ අංක 10643 ඇටර්නි බලපත්‍රයෙන් කොටුගොඩ, රද්දොළුව, සී. ඩී. ද සිල්වා මාවත, අංක 209/2 බී හි පදිංචි කුරුකුලසූරිය ඇන්ඩෲ රෝහන් ප්‍රනාන්දු මහත්මයාට දෙන ලද ඇටර්නි බලය අවලංගු කල බව මෙයින් දන්වමි.

කොඩිකාර ශ්‍යාමා චන්ද්‍රකාන්ති.

10-290

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## මහජන බැංකුව - මරදගහමුල

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ දිවුලපිටිය ප්‍රාදේශීය ආදායම් කොට්ඨාසයේ බෝඹුගම්මන ග්‍රාමයේ පිහිටි පින්නකැලේ වත්ත නමැති ඉඩම.

ඉඩමේ ප්‍රමාණය : රූ. 01, පර්. 04

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් **2022 නොවැම්බර් මස 9 වැනි බදාදා දින පෙ. ව. 11.00 ට** මහජන බැංකුව මරදගහමුල ශාඛා පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID -19 ක්‍රියා පිළිවෙතට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලවම පවත්වනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2000.05.26 දින ද, ඩේලි නිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල 2001.09.18 දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - මරදගහමුල දිවුලපිටිය පාරේ සැතපුම් 1 1/2ක් පමණ ගොස් වමට හැරී වලව්වත්ත පාරේ සැතපුම් 1/4ක් පමණ ගිය විට පාරේ දකුණු පස මෙම දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක් (සියයට එකක්),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් (සියයට දෙකහමාරක්) සහ එම කොමිස් මුදලට අදාළ සියලුම බදු,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,500.00ක්,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වේනොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත කළමණාකරු මහජන බැංකුව මරදගහමුල ශාඛාව වෙත ගෙවිය යුතු ය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක.

ප්‍රාදේශීය කළමනාකාර,
මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,

අංක 131, නුවර පාර,
බැලුම්මහර, මුදුන්ගොඩ.

දුරකථන අංක 033 - 2222325, 033 - 2225008, 033 - 2231901
ෆැක්ස් අංක : 033 - 2226165, 033 - 2226741

''ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය''

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 126 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය :*
6 ඒ, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08
දුරකථන අංක : 011-2671467, 011- 2671468
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

10-226

---

HNB 71 - 2022

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී.- මොරටුව ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

## 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ජේ. ප්‍රනාන්දු විසින් සියල්ල ලියා සහතික කරන ලද අංක 2238 හා 1996.02.03 දින දරන අංක 4945 හා 2001.08.30 දින දරන අංක 6962 හා 2005.05.30 දින දරන අංක 8260 හා 2008.02.21 දින දරන අංක 9393 හා 2011.03.24 දින දරන අංක 10559 හා 2014.09.10 දින දරන අංක 10603 හා 2015.04.23 දින දරන අංක 10759 හා 2016.02.16 දින දරන සහ අංක 10984 හා 2017.02.28 දින දරන උකස් බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සෙන්ට් මේරිස් සෝ මිල්ස් යන විලාශය හා ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයේ යෙදී සිටින දෑදිගමුවගේ ප්‍රැන්සිස් නිමල් ඩයස් යන අය ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරයන් යටතේ අය විය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත සඳහන් දේපළ වර්ෂ **2022ක් වූ නොවැම්බර් මස 14 වැනි දින ප. ව. 12.30 ට** එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.-*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ (මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ 554 සී කොරලවැල්ල බටහිර ග්‍රාම නිලධාරී වසම තුළ) මොරටුව මහ නගර සභා සීමාව තුළ සමාජවාදී නිවහන් පෙදෙස, කොරලවැල්ලේ පිහිටි, මාදන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ජේ. එම්. පී. එල්. ද සිල්වා විසින් සාදන ලද අංක 11/95 හා 1995 පෙබරවාරි මස 08 දින දරන පිඹුරේ ලොට් 01 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද පර්චස් දහසයයි දශම නමයයි හය (පර්. 16.96) ක විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි සෑම සියළු දේ ද සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2022.08.19 දින දරන රජයේ ගැසට් පත්‍රය හා 2022.09.23 දිනැති මව්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.* - මොරටුව පැරණි පාලම අසල සිට මොරටුව - කොරලවැල්ල පොදු ප්‍රවාහන මාර්ගය ඔස්සේ කි. මී. 01.6 ක පමණ දුරක් ගමන් කර දකුණට හැරී (රජයේ බෙහෙත් ශාලාව ඉදිරිපිට) සමාජවාදී නිවහන් පෙදෙස (අඩි 30ක් පළල වාහන ගමන් කළ හැකි නගර සභා පාර) ඔස්සේ මීටර් 150 ක් පමණ දුරක් ඉදිරියට ගමන් කරන්න. ව. ප. අංක 21 දරන අදාළ දේපළ පාරේ වම්පස පිහිටා ඇත. (ශාන්ත මරියා ලී මෝල)

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,

4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් එක් දහස් පන්සියයක් (රු. 1,500) ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනුවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාළ ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු, (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකතන අංක : 011 - 2661826, 2661835.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත,
පටුවත, දොඩන්දූව.
දුරකතන අංක 071 - 3358434, 0779- 663420
Email : ejayawardhana77@gmail.com

10-229

---

**හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. - ප්‍රධාන කාර්යාල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසියයි

හෝකන්දර, තලවතුගොඩ පාරේ වරිපනම් අංක 23/65 සහ 23/65 ඒ දරන පරිශ්‍රයන් තුළ පිහිටි පිළිවෙලින් පර්චස් 10.15 සහ පර්චස් 9.55 විශාලැති අගනා පරිශ්‍රයන්

බස්නාහිර පළාතේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ කඩුවෙල මහ නගර සභා සීමාවේ බත්තරමුල්ල ඒකකය තුළ වික්‍රමසිංහපුර (අංක 479 සී) ග්‍රාම නිලධාරි වසම තුළ වරිපනම් අංක 23/65 සහ 23/65 ඒ තලවතුගොඩ හෝකන්දර පාර තලංගම දකුණ පිහිටි ''වැවකැලේ'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් සාදන ලද අංක 4289 හා 2007 ඔක්තෝබර් මස 01 වැනි දින දරන පිඹුරේ බෙදා වෙන් කර නිරූපනය කර ඇති කැබලි අංක 36A 36 B බිම් කොටස්.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් වස්ගමුව ක්ලෝතින් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද වාරික ණයක් ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් 2011 ජූලි මස 27 වැනි දින සහතික කරන ලද අංක 4095 දරන උකස්කරය ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ලොලුව විසින් 2013 පෙබරවාරි මස 26 වැනි දින අංක 3302 දරන උකස්කරය ද, 2015 මැයි මස 21 වැනි දින සහතික කරන ලද අංක 3567 සහ 2016 ජූලි මස 14 වැනි දින අංක 3695 දරන උකස් බැඳුම් මගින් වස්ගමුව ක්ලෝතින් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු උකස්කරු වශයෙන් සහ රවීන්ද්‍ර පුෂ්පකුමාර අබේසේකර සහ නානායක්කාර බෝපේ යමුනා තිසරනී වීරතුංග යන අය වස්ගමුව ක්ලෝතින් (ප්‍රයිවට්) ලිමිටඩ් හි හිමිකරුවන් අධ්‍යක්ෂකවරුන් වශයෙන් එකී සමාගම පාලනය සහ කළමණාකරණය කරන අතර ඒ අනුව සමාගමේ ආයතනික වැස්ම නිරාවරණය කළහොත් එවිට ඉහත කී රවින්ද්‍ර පුෂ්පකුමාර අබේසේකර සහ නානායක්කාර බෝපේ යමුනා තිසරනී වීරතුංග යන අය හැටන් නැෂනල් බැංකුව පී එල් සී විසින් වස්ගමුව ක්ලෝතින් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද මූල්‍ය සත්‍ය ප්‍රගතිලාභීන් ලෙසින් ඉහත කී උකස්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින් ඉහත සඳහන් දේපළ **වර්ෂ 2022 ක් වූ නොවැම්බර් මස 15 වැනි දින පෙරවරු 11.00 ට සහ 11.15 ට** අදාළ දේපළ පිහිටි පරිශ්‍රයන්හි දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා කරුණාකර 2022.08.26 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* සහ 2022.08.31 වැනි දින ''මව්බිම'' ''ඩේලි මිරර්'' සහ ''තිනක්කුරල්'' පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිශ්ඨවන මාර්ගය*.- කොළඹ සිට බත්තරමුල්ල කඩමංඩිය දක්වා ගමන් කර දකුණට හැරී කි. මී. 2ක් පමණ වික්‍රමසිංහ පුර නිවාස සංකීර්ණයට ප්‍රවිෂ්ඨ වන පාර දක්වා ගමන් කර වමට හැරී ITN රූපවාහිනී මධ්‍යස්ථානය පසු කළ වහාම දකුණට හැරී තාර සහ කොන්ක්‍රිට් දමා නිම කරන ලද ITN රූපවාහිනී මධ්‍යස්ථානය මායිමේ පිහිටි හෝකන්දර දෙසට ගමන් කරන පාරේ මීටර් 150ක් පමණ ගමන් කිරීමෙන් හමුවන 1 වන පටුමගට පෙර මෙම දේපළ පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 2,500 ක් ද, (6) විකුණුම් කොන්දේසි

සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,500 ක් ද වේ. ගැණුම් මිළේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි. දින 30ක් ඇතුළත ඉතිරි මුදල් ගෙවීමට අපොහොසත් වුවහොත් ගෙවන ලද 10% මුදල ආපසු නොගෙවනු ලබන අතර දේපළ නැවත විකිණීමේ අයිතිය බැංකුව සතු ය.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID -19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි නිර්දේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

දේපළ පිළිබඳ වැඩි විස්තර දැනගැනීම පිණිස කොළඹ 10, ටී. බී. ජයා පාරේ වරිපනම් අංක 479 දරන පරිශ්‍රයේ පිහිටි හැටන් නැෂනල් බැංකු පී එල් සී හි ජ්‍යෙෂ්ඨ කළමණාකරු - අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක 011- 2661828 හෝ 0112 661866 අමතන්න.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134 බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක 2873656, 011 - 2871184, 0777 672082, 0777 449452.

10-248

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංක - 74475077, 74475170, 74475261

කන්තලේ, රජඇල, අංක 694/4 හි චම්පිකා රයිස් මිල්ස් හි අයිතිකරුවන් වන රන්තිලක ගෙදර වීරසිංහ මහතා සහ රන්තිලක ගෙදර කරුණාදාස මහතා සහ කෝදාගොඩ ගමගේ පද්මිණි මහත්මිය සහ රන්තිලක ගෙදර නිමල්කා මදුවන්ති රන්තිලක මහත්මිය යන අයගේ හවුල් ව්‍යාපාරය යටතේ ඇති චම්පිකා රයිස් මිල්ස් සමාගමට අයත් උකස් කරන ලද දේපල විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017 ජූලි 07 දිනැති අංක 2027 දරන ගැසට් පත්‍රයේ හා 2017 ජුනි 27 දින ''ඩේලිනිව්ස්'' ''දිනමිණ'' හා ''තිනකරන්'' යන පුවත්පත් වල පළකරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍ර ලංකා බැංකුව කන්තලේ පරිශ්‍රයේ දී **2022 නොවැම්බර් මස 15 වැනි දින පෙ. ව. 11.00 ට**, කොළඹ 08, ෆෙයාර් ෆීල්ඩ් ගාර්ඩන්ස් අංක 06 A හි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහත්වරුන් විසින් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### පළමුවන උපලේඛනය

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 227/B දරන රජ ඇල ග්‍රාම සේවක නිලධාරි කොට්ඨාසයේ, රජ ඇල ග්‍රාමයේ (කට්ටලෙයි පත්තුව) පිහිටි රජඇල කොලනි නමැති ඉඩමෙහි ලොට් 780හි නැගෙනහිර පස බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 780 උතුරට : ලොට් 741 ද, නැගෙනහිරට : ලොට් 780 ද, දකුණට : ලොට් 781 ද, බස්නාහිරට : ලොට් 782 ද මායිම්ව එහි ඇති නිවෙස සහ වී මෝල සහිතව අක්කර එකයි පර්චස් විසිතුනයි දශම බිංදුවයි හයක (අ. 01, රූ. 0, පර්. 23.06) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ත්‍රිකුණාමල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/P/3/54 සහ 55හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු කේ. සෙල්ලපිල්ලෙ විසින් මෑතකදී සාදන ලද 1997 සැප්තැම්බර් මස 19 දිනැති අංක 553 දරන මිනුම් පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 227/B දරන රජ ඇල ග්‍රාම සේවක නිලධාරි කොට්ඨාසයේ, කන්තලේ රජ ඇල කොට්ඨාස අංක 4හි පිහිටි රජ ඇල, රජ ඇල කොලනි ඒකක 4/694 නමැති ඉඩමෙහි අංක 553 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : පාර ද, නැගෙනහිරට : පාර ද, දකුණට : එකී අංක 553 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 2 ද, බස්නාහිරට : F.T.P. 2හි ලොට් 782 ද මායිම්ව එහි ඇති නිවස සහ වී මෝලකින් සමන්විත වන අතර එකී අංක 553 දරන පිඹුරට අනුව අක්කර එකයි පර්චස් විසි තුනයි දශම බිංදුවයි හයක (අ. 1, රූ. 0, පර්. 23.06) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

#### දෙවන උපලේඛනය

ඉහත දෙවන උපලේඛනයේ විස්තර කළ ඉඩමට හා පරිශ්‍රයට සවිකර ඇති සියලු යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණවලට පහත සඳහන් දෑ අයත් වේ.

Description of Machinery (යන්ත්‍රෝපකරණවල විස්තරය)

1. Two 18 feet Elevators with 2 H.P. motors
2. Paddy cleaner with 3 H.P. motor
3. Two paddy stoners within 2 H.P. motors
4. Two Hullers with 10 H.P. motors
5. Two 12 feet elevators with 2 H.P. motors
6. Automatic elevator and Huller with 10 H.P. motor
7. Separator with 15 H.P. motors
8. Polisher with motor
9. Two Rice Stoner with 2 H.P. motors
10. 17 feet Elevator with 2 H.P. motor
11. Winnower with 2 H.P. motor
12. Winnower with 2 H.P. motor
13. Paddy drier with 30 H.P. motor
14. Paddy cleaner with 3 H.P. motor
15. Huller with 25 H.P. motor
16. Two 12 feet elevators with 2 H.P. motor
17. Two winnower fans with 2 H.P. motors
18. Polisher with 25 H.P. motor and starter
19. Rice Stoner with 3 H.P. motor and starter
20. 18 feet Elevator with 2 H.P. motor and starter
21. 12x4x4 feet Rice Bin
22. Grader with motor and starter
23. 110KVA Generator
24. Boiler
25. Blower
26. Suction Fan

සහ සෑම ආකාරයකම මෙන්ම දැනට කුමන ආකාරයකට හෝ විස්තර කර ඇති සහ මින් පසුවට මෙම පළමු උපලේඛනයේ විස්තර කර ඇති පරිශ්‍රයට සවි කිරීමට නියමිත වෙනත් සියලු දේ ද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ටී. විජයබාස්කර්, ,
ශාඛා කළමණාකරු.

ලංකා බැංකුව,
කන්තලේ ශාඛාව,
2022.09.26

10-275

**කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් - මහනුවර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

එනම් කැන්ඩි රෝයල් ඉන්ග්ලිස් ස්කූල් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායි වශයෙන්, කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් (ලියාපදිංචි අංක PB 4847 දරන) නමට ප්‍රසිද්ධ නොතාරිස් ඒ. සී. නදීශා විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2018.12.27 දිනැති අංක 555 දරන උකස් බැදුම්කර මත ලැබිය යුතු මුදල් ආපසු ගෙවීම පැහැර හැර ඇති හෙයින් ,

කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් විසින් මා වෙත පවරන ලද බලතල අනුව පහත සඳහන් දේපළ වර්ෂ **2022 නොවැම්බර් මස 21** වැනි දින පහත එක් එක් වෙන්දේසියෙහි සඳහන් කර ඇති වේලාවන්හි දී එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

**උපලේඛනය**

**1 වන වෙන්දේසිය** - වේලාව පෙ. ව. 11.00

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කඩවත් සතර ගඟවට කෝරළේ මහනුවර මහනගර සභා සීමාව තුළ සහ මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අම්පිටිය දකුණ අංක 253 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වික්ටෝරියා ඩ්‍රයිව් දූන් සංඝරාජ මාවතේ පිහිටි මහාමායා මාවතේ වරිපනම් අංක 2/1 දරන බලයලත් මිනින්දෝරු පී. ජී. එස්. කේ. ජයරත්න විසින් මැන සාදන ලද අංක 648 සහ 2010 අගෝස්තු මස 10 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ''1'' දරන කැබැල්ල ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම එකයි එකක් (පර්. 15.11) වන ඉඩම් කොටස සහ ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ වැවිලි සහ සියලුම දේ වන අතර මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුමේ/පත්ඉරු අංක A 436/287 හි ලියාපදිංචි කර ඇත.

එකී 648 දරන පිඹුරේ කැබලි අංක 2 (පාරක් සඳහා වෙන් කරන ලද) දරන කොටසේ මාර්ග අයිතිය සමග.

*දේපලට පිවිසීම.* - මහනුවර නගරයේ සිට (ඔරලෝසු කණුව අසල සිට) මහනුවර සංඝරාජ මාවතෙන් (වර්තමානයේ මහනුවර-දිගන ප්‍රධාන පාර ලෙස හදුන්වන) කි. මී. 1.5 ක් මහාමායා මාවත හංදිය දක්වා පැමිණෙන්න. පසුව දකුණු පසින් ඇති මහාමායා මාවතෙන් මීටර් 25ක් ගියපසු වරිපනම් අංක 2/1, මහාමායා මාවත ලෙසින් ඇති ප්‍රධාන පිවිසුමෙන් පැමිණි පසු දකුණු පසට වන්නට මෙම දේපල පිහිටා ඇත.

**දෙවන වෙන්දේසිය - වේලාව පෙ. ව. 11.30**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කඩවත් සතර ගඟවට කෝරළේ මහනුවර මහ නගර සභා සීමාව තුළ සහ මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අම්පිටිය දකුණ අංක 253 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වික්ටෝරියා ඩ්‍රයිව් දූන් සංඝරාජ මාවතේ පිහිටි මහාමායා මාවතේ වරිපනම් අංක 2/1 දරන බලයලත් මිනින්දෝරු පී. ජී. එස්. කේ. ජයරත්න විසින් මැන සාදන ලද අංක 648 සහ 2010 අගෝස්තු 10 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ''3'' දරන කැබැල්ල, ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් නවයයි දශම හයයි හතරක් (රූ. 1, පර්. 9.64) වන ඉඩම් කොටස සහ ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ වැවිලි සහ සියලුම දේ වන අතර මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුමේ/පත්ඉරු අංක ඒ 436/288 හි ලියාපදිංචි කර ඇත.

එකී 648 දරන පිඹුරේ කැබලි අංක 2 (පාරක් සඳහා වෙන්කරන ලද) දරන කොටසේ මාර්ග අයිතිය සමග.

*දේපළට පිවිසීම.* - මහනුවර නගරයේ සිට (ඔරලෝසු කණුව අසල සිට) මහනුවර සංඝරාජ මාවතෙන් (වර්තමානයේ මහනුවර දිගන ප්‍රධාන පාර ලෙස හඳුන්වන) කි. මී. 1.5 ක් මහාමායා මාවත හංදිය දක්වා පැමිණෙන්න. පසුව දකුණු පසින් ඇති මහාමායා මාවතෙන් මීටර් 25ක් ගිය පසු වරිපනම් අංක 2/1, මහාමායා මාවත ලෙසින් ඇති ප්‍රධාන පිවිසුමෙන් පැමිණි පසු වම් පසින් වන්නට මෙම දේපල පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - රජයේ ගැසට් පත්‍රයේ 2021.04.01 දින හා ඩේලි දිවයින, ද අයිලන්ඩ් සහ තිනකරන් යන පුවත්පත්වල 2021.04.07 දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරිය ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් ගැණුම් මිලෙන් 2.5% (සියයට දෙකහමාරක්) සමග අදාළ බදු මුදල්,
4. සියලුම ප්‍රචාරක වියදම් සමග වෙන්දේසිය සඳහා වන සියලු මුදල්,
5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,000.00
6. විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තු.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුලත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10%ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

වැඩි විස්තර සඳහා විමසන්න. අයකර ගැනීම් ප්‍රධානී, කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ්, අංක 696, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක 011 7640450.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

චන්දිමා ප්‍රියදර්ශනී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු.

අංක 9-1, හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම.
දුරකථන අංක 011 2173282, 071 - 4318252.

10-319